# දේශීය තෛල වර්ගවල අභිචාරාත්මක සංස්කරණ විධි සහ ආධි - වෛද්‍යක ව්‍යවහාරයන් පිළිබඳ සාහිත්‍යයික පර්යේෂණයක්

## ප්‍රවේශය

ශ්‍රී ලාංකේය දේශීය වෛද්‍ය ක්‍රමය හුදෙක් උත්තර භාරතීය ආයුර්වේදය මහා සම්ප්‍රදායෙන් බිඳී ආ චූල සම්ප්‍රදායක් ම නොව මේ රටේ පාරම්පරික අනන්‍යතාව කැටි කොට ගත් සුවිශේෂ ශාස්ත්‍ර ප්‍රණාලියක් බව පිළිගැනීමට සාක්ෂි එමටය. විශේෂයෙන්ම, පාරම්පරික දැනුම් පද්ධතීන් තුළ සන්ධානගත වී ඇති දේශීය මූලාකෘතීන්හි අන්‍යෝන්‍ය අන්තර් සම්බන්ධතාව මත ගොඩනැගෙන විද්‍යා - කලා - ධර්ම - ශාස්ත්‍ර සමුදාය අතිශයින් විශිෂ්ටය. වෛද්‍ය ක්‍රමය, ජ්‍යොතිෂය, යාතුකර්ම, කෘෂිකර්මය, ආර්ථික ක්‍රමය, පරිසරවේදය, සෞන්දර්යය, සංගීතය, නර්තනය ආදි කොට ඇති සියලු සමාජ ක්‍රියාකාරකම් එකිනෙක අවියෝජනීය ලෙස බැඳී පවතින බව පෙනේ. මේ සියළු දැනුම් සම්භාරයන් තුළ විමසුම් සහිත අන්වේෂණයෙහි යෙදෙන පර්යේෂකින් හට ඉතා සිත් ගන්නා සුළු මෙන් අතිශය වැදගත් මූලාශ්‍රයන් මතු කර ගැනීම උගහට නොවේ. ඖෂධීය ශාකයන්හි ගැබ්ව ඇති චිකිත්සීය ශක්තිය සම්බන්ධයෙන් අපේ පැරැණියන් දැන සිටියේ හුදු ද්‍රව්‍යමය සංඝටක මත පාදක වූ භෞතික ගති ලක්ෂණ සමුච්චයක් ලෙස පමණක් නොවේ. ඒවායේ අධිභෞතික බලශක්ති ප්‍රවාහයන්හි හැසිරීම ඉතා සියුම් ලෙස නිරීක්ෂණය කොට අධ්‍යයනය කිරීමෙන් ලත් අවබෝධය වඩාත් ප්‍රබලව කැපී පෙනෙන විෂයයකි දේශීය තෛල සංස්කරණ විධිය. එබඳු තෛල සංස්කරණයන් පිළිබඳ කරනු ලැබූ සාහිත්‍යයික පර්යේෂණයක ප්‍රතිඵල මෙම පත්‍රිකාව තුළ සාකච්ඡා කෙරේ.

## අරමුණු

1. දේශීය තෛල සංස්කරණයන් පිළිබඳ මූලික සාහිත්‍යයික ගවේෂණයක් සිදු කොට ඒවායේ අභිචාරාත්මක ගති ලක්ෂණ අධ්‍යයනය කිරීම
2. එබඳු අභිචාරාත්මක සංස්කරණ විධි සහිත තෛල වර්ග වල ආධි - වෛද්‍යක ව්‍යවහාරයන් හඳුනා ගැනීම සහ ඒවා විධිමත් ලෙස වර්ග කිරීම
3. ආධි - වෛද්‍යක ව්‍යවහාරයන් සහිත දේශීය තෛල සංස්කරණයන් සඳහා භාවිත කරනු ලබන ඖෂධීය අමුද්‍රව්‍යවල ද්‍රව්‍යාත්මක අනන්‍යතාව විමර්ශනය කිරීම

## ක්‍රමවේදය

1. මුද්‍රිත ප්‍රකාශනවල සඳහන් ආධි - වෛද්‍යක ව්‍යවහාරයන් සහිත දේශීය තෛල සංස්කරණ ලේඛනයක් සකස් කිරීම.
2. එබඳු තෛල සංස්කරණ විධි වල දී විවිධ අවස්ථාවන්හි අනුගමනය කරන අභිචාරාත්මක ක්‍රියාවලිය නිර්වචනය කිරීම
3. එබඳු තෛල සංස්කරණයන්හි සඳහන් ආධි-වෛද්‍යක ව්‍යවහාරයන් පිළිබඳ ලේඛනයක් සකස් කිරීම
4. ඒවාට අදාළ ඖෂධීය ශාක සහ ශාකමය කොටස් සම්බන්ධයෙන් ලේඛනයක් සකස් කිරීම
5. මෙම තෛල සංස්කරණය සඳහා යොදනු ලබන සත්වජ සහ පාර්ථිව ද්‍රව්‍යවල ලේඛන සැකසීම
6. මෙම තෛල සංස්කරණයට අදාළ අතිරේක දත්ත එක්රැස් කිරීම.
7. මෙම තෛල වර්ග භාවිතයේදී අනුගමනය කළ යුතු විශේෂ උපචාර විධි සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම
8. මෙම ඉහත කරුණු සියල්ලම විමර්ශනය කොට මූලාශ්‍ර සහිතව සාක්ෂ්‍ය-පාදක ශාස්ත්‍රීය විශ්ලේෂණයක් කිරීම.

## තෛල නාමලේඛනය

සමීක්ෂණය කළ තෛල නාම ලේඛනයට තෙල් වර්ග 41 ක් ඇතුළත් විය. ඒවා මෙසේය. විදුරග තෛලය, දේවරාජ අංගම් තෛලය, යක්ෂ දුවිලි තෛලය, මහා හෙණරාජ තෛලය, හෙණරාජ තෛලය, ප්‍රාණජීව තෛලය, දිව්‍යාංගනාදී තෛලය, විකාර තෛලය, නාරනන්ද විෂ්ණුරාජ තෛලය, විනරාජ තෛලය, බුද්ධරාජ තෛලය, ඉරුදපන තෛලය, ශ්‍රියාකාන්ති තෛලය, ශ්‍රී විභූති වීරපුත්‍ර තෛලය, චින්තාමාණික්‍ය තෛලය, අංගම්රාජ තෛලය, දේශීය නාරායන තෛලය, යක්ෂභූත තෛලය, මහා යක්ෂභූත තෛලය, විදුරිඳු තෛලය, ග්‍රහසාප තෛලය, සන්නිකුමාර තෛලය, විනරාජ තෛලය, ගොපලු තෛලය, වීරමානික්කන් තෛලය, මහා සන්නිකුමාර තෛලය, බ්‍රහ්ම සරස්වතී තෛලය, සරස්වතී තෛලය, චන්ද සරස්වතී තෛලය, මහා සරස්වතී තෛලය, ධාරණ තෛලය, රාජ තරංගණී තෛලය, දිව්‍යරාජ තෛලය, අග්නි සරස්වතී තෛලය, අසුරනන්ද තෛලය, වීදුරුමාන තෛලය, මහා ජීවකානන්ද තෛලය, කෝලසන්නි තෛලය, දේවකුමාර තෛලය, සිද්ධාර්ථ තෛලය, චන්ද්‍රකාන්ති තෛලය. මේවායේ නාමකරණය දෙස විමසිලිමත් වුවහොත් ඒවා සාමාන්‍යයෙන් ගුප්ත ශාස්ත්‍රීය ගති ලක්ෂණ ප්‍රකට කරන බව පෙනේ.

## සංස්කරණ ක්‍රියාවලිය

මෙම තෙල්වලට අදාළව සංස්කරණ ක්‍රියාවලියේ විවිධ අවස්ථා 17 ක් හඳුනා ගන්නා ලදී. ඒවා නම් පිළිවෙලින් ඖෂධීය අමුද්‍රව්‍ය එකතු කිරීම, ඖෂධීය අමුද්‍රව්‍ය අඹරා ගැනීම, පාදක තෙල් වර්ග සපයා ගැනීම, ඖෂධීය අමුද්‍රව්‍ය තෙලට මිශ්‍ර කිරීම, විශේෂ ඖෂධීය ද්‍රව්‍ය ප්‍රක්ෂේප කිරීම, තෙල ඌරු කිරීම, තෙල සිදින ස්ථානය ආරක්ෂා කිරීම, තෙල ලිප තැබීම, තෙලට ගින්දර දැමීම, කල්කය යෙදීම, තෙල පදම් ගැනීම, තෙල බෑම, තෙල සිසිල් වීමට හැරීම, තෙල පෙරා ගැනීම, තෙල පේ කිරීම, තෙල අසුරා තැබීම, තෙලට කලින් කල පුෂ්ප බැදීම යන පියවරයන් වේ

## ශාකමය ඖෂධ

තෛල සංස්කරණයේදී යොදා ගන්නා මූලික ශාකමය ඖෂධ වර්ග 200 කට අධික සංඛ්‍යාවක් හඳුනා ගන්න ලද අතර ඊට කල්කය සඳහා යොදනු ලබන සරක්කු ද්‍රව්‍ය ඇතුළත් නොකරන ලදී. බුලත්, බක්මී, බැවිල, බෝදළු, පිල, පනම්පෙති, නික, නියද, ලීම. පඹුරු, නුග, පුස්, පහුල්, නස්නාරන්, නාරං, නාගදරණ, නා, තුන්බෝ අත්තන, තුනැස්ස, රන්තැඹිලි, තිඹිරි, රත්නිටුල්, රත්මල්, ලුණුවරණ, ගම්මිරිස්, ගංසූරිය, ගැඩුඹ, මී, අන්නාසි, එරබදු, අත්තන, ඉත්ත, අරත්ත, එඬරු, ඉරමුසු, අඹ, කඹුරු, කුඩුම්රිස, කුරුඳු, ඉගුරු, කුකුරුමාන්, කුප්පමේනිය, මිල්ල, කිකිරිඳිය, කඳුලැස්ස, කරපිංච, කරල්සැබෝ, කරඳ, මිදි, කයිල, කංසා, කහදෙමට, කහ, කළු වෙල්ලන්ගිරිය, සුදු වෙල්ලන්ගිරිය, කටුකරඬු, කැප්පෙටියා, කළුවා අල, කාමරංගා, අනෝදා, ඉය, අවරිය, අංකෙන්ද, එළබටු, එළ, ඔළිඳ, ඇද්දෙමට, බෙලි, බෝවිටියා, නෙළුම්, වේලා, තොටිල, ගොරකා, ගොඩමානෙල්, බේදුර, දෙහි, දොඩම්, වෙනිවැල්, දිගැස්ස, දං, දළුක්, සන්නිනායම්, යකිනාරන්, යකිවනස්ස, යක්බේරිය, එළ වරා, වම්මුතු, වටැස්ස, වදකහ, වංඇපල, මූනමල්, මුරුවා, මුරුංගා, මදුරුතලා, මහනිඹ, මැල්ල, මානුග්, මාරා, මාළුඬරු, හීරැස්ස පළු, හරංකහ, හාතාවාරිය, සබරල, සීනුක්, සපු, සිවිය, සිදලං, සැවැන්දරා, සස්සඳ, සාරණ, තුඹ, හීන්දද, දදකිරිය, නිදිකුම්බා, එළපිටවක්කා, ඇත්කරපිංචා, රසකිඳ, ගොඩපර, සමදරා, ඉගිනි, කළුහබරල, අට්ටික්කා, ගොඩකිරිල්ල, හීන් උඩැත්තා, සව්කෙන්ද, පුපුල, තුඹ කරවිල, කෙටල, හික්, වැල්රුක්අත්තන, මුඩමහණ, පතුක්, කිරිබදු, සතුරුසම්මැට්ටිය, දුටුසතුටු, වාතමැඩක්කිය, බිම්පොල්, ගිරිතල්ල, කළුතලා, ගුරුල්ල, රුක්අත්තන, මොනරකුඩුම්බිය, මකුළුවැන්න, ලේවැන්න, නෙළුම්, විළඳවැන්න, මීමිනි, උඳුපියලි, ඉද්ද, කිරිඅගුණ, සුදු බැවිල, වැටකෙයියා, මුකුණුවැන්න, ඇවරිය, විෂ්ණුකාන්තිය, සූර්යක්‍රාන්ති, කෝවක්කා, වැල් කහඹිලියා, මකුල්, කප්‍රවල්ලිය, රත් නිවිති, සුදු නිවිති, බැලතණ, පෙතන්, මුවකිරිය, දුනුකේ, කෝන්, ගල්කුර, කැබෙල්ල, කොටදිඹුලා, බටදොඹ, තරණ, රත්

කොහොඹ, යක් එරබදු, ගෝනල, ලෝලු, තුඩවැඩියා, දිවිකදුරු, කිනිහිරිය, දිවිපහුරු, වැල් පෙනෙල, වෙරළු, ඉඳි, කිතුල්, යකාබැදිවැල්, මස්බැද්ද, රණවරා, අන්දර, විසදුලිය, රුක්, පුලිල, අහු, කොබෝලිල, සාමදාන, සුළුනයි, මානයි, කුඩා නාම්බා, මහා නාම්බා, කුඩා හැඩයා, මහා හැඩයා, වනරාජා, සඳරාජ

## භාවිතා කරන විලාසයන්

සාමාන්‍ය තෙල් වර්ග භාවිතා කරන ආකාර වලට වඩා විවිධ විලාසයන් රැසක් මෙම තෙල් වල දක්නට ලැබීම විශේෂයකි. එබඳු විලාසයන් 24 ක් පමණ හඳුනා ගැනීමට හැකිවිය. ඒවා නම් බීම, ඇඟ ගැල්වීම, හිසට දැමීම, නලලය තික ලෑම, කණට හෙළීම, වස්ති කිරීම, අංජනම් ලෑම, නස්නය, අතේ තබා ගැනීම, අල්ලේ ගෑම, පහන් තැබීම, දෙවුර ගැල්වීම, කන්වල ගෑම, දැළවර ගෑම, දකුණු බැමේ ගෑම, කටියේ ගෑම, දුම් ඇල්ලීම, පන්දම් පත්තු කිරීම, බුලතෙහි ගා කෑම, බත් සමග වැළඳීම, ආයුධවල ගෑම, කොඩිවල ගෑම, වේවැලට අඩස්සි කර දකුණත ගෙන යාම, මුහුණට දුම් ඇල්ලීම යනුයි. මහා සරස්වති තෛලය වැනි තෙල් භාවිතා කිරීමේදී දිව ගෑමට අස් කෙන්දක් යොදා ගත යුතු බව නියමයකි.

## ආධි - වෛද්‍යක ව්‍යවහාරයන්

සාමාන්‍ය ඖෂධීය තෛල වර්ග භාවිත කරන වෛද්‍යමය තත්ත්වයන් හැරුණු කොට මෙම තෙල් වර්ග වලට ආවේණික වූ ව්‍යවහාරයන් රැසක් තිබේ. ඒවා සාමාන්‍ය වෛද්‍යමය අවස්ථා ඉක්මවන හෙයින් ඒවා ආධි - වෛදික ව්‍යවහාරයන් ලෙස නම් කිරීම යෝග්‍ය බව සිතමි. මෙහිදී විශේෂයෙන්ම, අතිමානුෂීය බලවේග වලින් සිදුවන විපත් මෙන්ම වෙනත් බාහිර හේතූන් නිසා ඇතිවිය හැකි අනිෂ්ට විපාක වලක්වා ගැනීම බහුලව අපේක්ෂා කෙරේ. මෙම ව්‍යවහාරයන් තුළ පැරැණි සමාජය තුළ සතුරන් විසින් කරනු ලබන නොයෙකුත් අභිචාරාත්මක විපත් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය. සමහර තෙල් වර්ග නිවසේ තබා ගැනීම, පහන් දැල්වීම, අතේ තබා ගැනීම ආදියෙන් පමණක් ප්‍රතිඵල ලැබීමේ සමත් බව කියැවේ. විශේෂයෙන්ම, යකුන් පළවා හැරීමේ ලා උපයෝගී වන බලයක් මෙම තෙල් වර්ගවල අන්තර්ගත යැයි විශ්වාස කෙරේ. එබඳු යක්ෂාවේශයන් මෙල්ල කිරීමේ ක්‍රම ද ඒවායේ අන්තර්ගතය. සමහර කෝවිල් හෝ දේවාල වල බලය හීන කිරීමටද මෙම තෙල් යොදන බවට ද ප්‍රකටය. භූමි ප්‍රශ්න අරබයා ඉස්මතු වන ගම් හබ සඳහා ද සමහර තෙල් වර්ග නිර්දේශිතය. තවත් අවස්ථාවෙක සතුරන් මෙල්ල කළ හැකි අන්දමේ අභිචාරයන් ද සඳහන්ය. ධාරණ ශක්තිය ලැබීමට මෙබඳු තෙල් වර්ග භාවිතා කරයි. යම් යම් අනවින කොඩිවින ආදිය කායික රෝග බවට පත්වන ආකාරය සම්බන්ධයෙන් යම් ඉඟියක් සමහර තැනෙක පෙනේ. එසේම, නඩු හබ, වාද විවාද, තරග, යුද්ධ ජය ගැනීමට ද මෙබඳු තෙල් උපයෝගී කරගත් බව ද සඳහන්ය. විශේෂයෙන්ම, සමහර තෙල් වර්ග සුදුවෙන් දිනීමට ද යොදා ගත් බව පෙනේ. එසේම නිධන් වස්තු ලබා ගැනීම වැනි කටයුතු සඳහාද මෙබඳු බලගතු තෙල්වර්ග භාවිතා කර තිබේ. සාමාන්‍යයෙන් ගේ දොර දොර දියුණුවටද මෙම තෙල් වල පිහිට පැතූ බව පැහැදිලිය. ස්ත්‍රීන් වශී කිරීම සඳහා මෙබඳු තෙල් ව්‍යවහාර කරන බව පෙනේ. වන සතුන්ගෙන් සිදුවන උවදුරු වැළකුමට ද මෙම තෙල් යෙදේ. අංගම් 4448 ක්, කොඩිවින 4472 ක්, කෝල සන්නි 7446 ක් සන්නි 28 ක්, දේව සමයං 9,60,000 ක් ඇති බව සඳහන්ය.

ප්‍රධාන වශයෙන්ම තෛල ප්‍රයෝග කරන ආධිවෛදික අවස්ථා ලෙස හඳුනාගත හැකි රෝගාබාධ බොහෝ සෙයින්ම භූත දෝෂ සමග බැඳී තිබේ. උණ ගිනියම්, යක්ෂ මායම්, යක්ෂ දෝෂ, භූත දෝෂ, ප්‍රේත දෝෂ, යක්ෂ විකාර, ගෙවල දොස්, පිල්ලි, අංගං, සූනියම්, වැල් පැන්නුම්, ඉරි පැන්නුම්, අනවින දෝෂ, කඳට වැදුණ වින ඔල්මාද, දේව සමයං, වදුරු ලෙඩ, ස්වපන භය, ආමියා, ඇලියා, වන සත්ව උවදුරු, රාජ උදහස, අකල් මරණ, විපරිත සන්නි, යන්ත්‍ර මන්ත්‍ර පැන්නුම්, රූප කටු ගැසුම්, දෙවොල් පූනා, වටුක සූනියම්, දඬු මරණ, නැකැත් හිං මර, නිල ඇනුම් මර, ගම් හබ, භූමිපාලු, ගම්පාලු, කටු හිර, කතුරු කාලම්, මල් සැර, පොරෝ අංගං, ග්‍රහ දෝෂ, ඉනා බන්ධන, තුවක්කු හිර බන්ධන, හිර වැළකුම්,

බුලත් මැතුරුම්, අග්නි සැර, කැපුම් කෙටුම්, නාග පුදන්, වෙඩි සැර, හී සැර, කෝල, නුවණ ලැබීමට, සබෙන් දිනීමට, ස්ත්‍රී වශියට, දියුණුවට, සිරියාව ඇතිවීමට, නිධන් ගැනීමට, බෙහෙත් ජීවමට, සතුරුන් මිතුරු වීමට, යුද්ධ දිනීමට, රාජ වශී, සර්ව වශී, අංගම් පොර වලින් දිනීමට, ඉරු දූපනයට ආදී වශයෙන් විවිධ අවස්ථාවන්ට මෙම තෙල් උපයෝගී කර ගනු ලබයි

## තෛල සංස්කරණ ස්ථානයේ අනුගමනය කරන උපචාර විධි

තෙල සිදීමේදී එහි බලය වැඩි කර ගැනීම සඳහා අනුගමනය කරන විශේෂ උපචාර ක්‍රම විශාල සංඛ්‍යාවකි. මේවායේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ එම ක්‍රියාවලිය වඩාත් විධිමත් ව ක්‍රමානුකූල ලෙස ශාස්ත්‍ර යුක්තියට අනුගතව සිදු කිරීමයි. ඖෂධවල ශක්තිය නිසි ලෙස තෙලට ප්‍රයෝග කිරීමත්, එම ස්ථානය පවිත්‍රව සහ එහ කාර්යයට ගැලපෙන පරිදි පවත්වා ගැනීමත් ඊට සම්බන්ධ වන අය තුළ එම කාර්යය සම්බන්ධයෙන් කැපවීමක් ඇති කිරීමත් මෙහිදී සිදුවේ. තෙල ලිප තැබීමෙන් පසුව එහි ආරක්ෂා සඳහා කන්‍යා හුය ඇදීම හෝ පිරිත් නූල් ඇදීම කරනු ලැබේ. තෙලක් සිදීමේදී පිරිසිදු බව ඉතා වැදගත්ය. වටතිර ඇදීම, උඩු වියන් බැදීම, මල් වියන් බැදීම (මලලොඹු මාලා ගොතා), කොළ අතුවර්ග එල්ලීම, බිම ගොම පිරිමැදීම, ලිප වට කර ගොප් වැල් බැදීම, වළු මල් බැදීම, මල් බුලත් තටුව සැදීම, රත්රන් පිදීම, රිදී පිදීම, කන්නාඩි පිදීම (කැඩපත් පිදීම), සතර කොන ගල් සැදීම, සතර කොන දෙහි කණු සිටුවීම, පිරිත් නූල් ඇදීම, කන්‍යා හුයක් ඇදීම, මුණ්ඩාසනය බැදීම, කඩු දැරීම, රුද්‍රාෂ්ටක වැල් දැරීම, විහාර බෝ මැඩ මුල පේවීම, දේවාල විහාර බිම, දුම්දීම, පහන් පිදීම, තටු පිදීම, මල් එල්ලීම, පඬුරු පිදීම, සුවඳ සඳුන් කස්තුරි පිදීම, කහ දියර ඉසීම, සඳුන් කිරිපැන් ඉසීම, ඉස් සෝදා පිරිසිදු වීම, පිරුවට ඇදීම, දෙවියන්ට පොල් ගැසීම, මුකවාඩම් බැදීම, මඩුවක් මැදීම, ගේ මැද ලිප බැදීම, සිද්ධ යෝගයෙන් ඇරඹීම, කිළිකණු අත් හැරීම, කටින් ලිපට නොපිඹීම, සතර කොන් සිව් වරන් දෙවියන්ට කැප කිරීම, සංඝයා වහන්සේ වඩමවා පිරිත් දෙසීම, බ්‍රාහ්මණ ආභරණයෙන් සැරසීම ආදී නොයෙකුත් චාරිත්‍ර විධි ඒ අතර වේ.

## තෙල් ජිවම් කිරීම

මෙම තෙල් වර්ග අතුරින් ඒවා සංස්කරණයේදී විශේෂිත මන්ත්‍රයකින් ජීවම් කර ගැනීමට නියමිතව ඇත්තේ තෙල් වර්ග 8 ක් පමණි. අනෙක් තෙල් වර්ග පොදුවේ නවගුණ මන්ත්‍රය, රතන පිරිත හෝ වෙනත් දැහැනකින් ජීවම් කර ගැනීමට නිර්දේශිතය. යක්ෂ දුවිල තෛලයට රතන, ගිනි සහ ආටානාටිය යන තුන් පිරිතම කිය යුතු බවට සඳහන්ය. සමහර විශේෂ තෙල් වර්ග සම්බන්ධයෙන් තෙල සිදීමේ විවිධ අවස්ථා වලදී මන්ත්‍ර දැහැන් භාවිත කිරීමට නියම කොට තිබේ. ගෙය පිරිසිදු කිරීම, ඖෂධ එකතු කිරීම, ඖෂධ පේ කිරීම, බෙහෙත් කෙටීම, ලිප බැදීම, සරක්කු ඇඹරීම, තෙලට දැමීම ආදී අවස්ථා මීට ඇතුළත්ය. එසේම තෙල භාවිත කිරීමේ දී එබඳු මන්ත්‍ර ජීවම් කරන බව ද සඳහන්ය. මෙම තෙල් වර්ග සංස්කරණයේදී යොදා ගනු ලබන විශේෂ දැහැන් තිබේ. ඒවා අතර සරස්වතී දැහැන, විෂ්ණු දැහැන, කන්දකුමාර දැහැන, දඩිමුණ්ඩ දැහැන, ඊශ්වර දැහැන, ගණපති දැහැන, සූනියන් දැහැන,  වල්ලි දැහැන, උමා දැහැන, කාලි දැහැන, බ්‍රහ්ම දැහැන, ව්‍යාඝ්‍ර දැහැන, සූරිය දැහැන,  අංගුලිමාල දැහැන, ආලවක දැහැන ප්‍රධානය

## ඖෂධ යෙදීම

තෙලට ඖෂධ වර්ග යෙදීමේ ප්‍රධාන අවස්ථා කිහිපයකි. එසේම මෙම තෙල්වලට යොදනු ලබන ඖෂධ වර්ග කිහිපයක් ම වෙන් කොට දැක්විය හැකිය. අමු ශාකමය ඖෂධ වර්ග වන කොළ, දළු, පොතු, මුල්, ගෙඩි, ඇට, අල වර්ග කොටා ඒවායේ යූෂ හෙවත් ඉස්ම (කුඹුරු, කොහොඹ, පුස්, තෝර, කංසා, අත්තන, ඉගිනි, මී, දෙහි, දොඩම්, සස්සඳ, ඉරමුසු, කරල්සැබෝ, එළ ඔළිද, එළ දෙළුම්, ෂමදරා) වියළි ඖෂධ වර්ග තම්බා සකසනු ලබන කෂාය

## වියළි ඖෂධීය ද්‍රව්‍ය කොටා සකස් කර ගනු ලබන චූර්ණය

පාර්ථිව ද්‍රව්‍ය (මුතු, මැණික්, යහුණු, ඌසි, කාන්දම්, මයුර කාන්දම්, රත්රන්, රිදී, කිරිගරුඬ, රසදිය, තඹ, පිත්තල, වානේ, සක් ඇට, එළ පළිඟු, කහ පළිඟු)

විශේෂයෙන් කල්කය ඇඹරීමට නියම කර ඇති කිරි වර්ග, ඇඹුල් වර්ග සහ ඉස්ම වර්ග (එළගොම ඉස්ම, කස පැන් දිය, පිනිදිය, අමු කහ ඉස්ම, මී පැණි, වරා කිරි, කළාදුරු අල ඉස්ම, හීන් බෝවිටියා ඉස්ම, සුදුලූනු ඉස්ම, දෙහි ඇඹුල්, ඉඟුරු යුෂ, සඳුන් දිය, කළු හීනැටි හාල්, දුටු සතුටු ඉස්ම, දොඩම්, පැඟිරි, හිඟුරුපට ඉස්ම)

වෙනත් ද්‍රව වර්ග (කළු උක් පැණි, පිනිදිය, එළකිරි, රන් තැඹිලි කිරි, පොල් කිරි, ගොන් තැඹිලි කිරි, තැඹිලි කස පැන් දිය, එළ මුත්‍රා, එළමෝරු, කාඩිදිය, එළුකිරි, මී මෝරු, පාතාල මදු, පුහුල් ඉස්ම, කෝමාරිකා යුෂ, ගොරකා, ඇඹුල්, දෙහි ඇඹුල්, දොඩම් ඇඹුල්, සියඹලා ඇඹුල්, දෙමට පල යුස, අන්නාසි ඇඹුල්, කාමරංගා ඇඹුල්, ඉඳිබඩ ඉස්ම, කිතුල්බඩ ඉස්ම, හිරැස්ස පළු ඉස්ම)
මැලියම්, දුම්මල, ඉටි, ලාකඩ, කොහැල්ලෑ

සත්වජ ද්‍රව්‍ය (ඉත්තෑ කුරු, මොනර පිල්, දිම් බිජු, ගේ කිරිලි බිජු, මී අං කුඩු, කගවේන අං, කගවේන මාළු, ගෝරෝචන, කස්තුරි, මීනාම්බර, ඇත්මද, ඇත් දත් කුඩු, ඇලෙලි, උණ හපුළු මස්, බකමූණු මස්, මයින මස්, දිවි වසුරු, කිඹුල් වසුරු, ඌරු වසුරු, වවුල් වසුරු, මොනර වසුරු, සැවුල් වසුරු, දඬුවැල්බැඉටි, බඹර ඉටි, මී ඉටි, උරුලෑ සට්ටං, ගැරඬි හැව, නයි හැව, හික්මියන්)
විශේෂ මල් වර්ග, මල් රේණු සහ සුගන්ධ ද්‍රව්‍ය (පිච්ච, පෙතන්, සපු, නා, දුනුකේ, නෙළුන්, මානෙල්, රත්මල්, කොබෝලීල, රණවරා, සව්කෙන්ද)

තෙල් වර්ග (තල තෙල්, එඬරු තෙල්, අබ තෙල්, පොල් තෙල්, පරණ පොල් තෙල්, තැඹිලි තෙල්, මී තෙල්, කොහොඹ තෙල්, එළඟි තෙල්, දොඹ තෙල්, දුහුදු තෙල්)

සෑම තෙලකම පාහේ ද්‍රව්‍ය ජලය සමග යොදා ඌරු කිරීම නොහොත් කාඩි කිරීම අනුදන තිබේ.* විශේෂයෙන්ම ඉස්ම වර්ග සහ කිරි වර්ග ගැනීමේ ඒවායේ ඖෂධීය ගුණය ආරක්ෂා කර ගැනීම පිණිම ජලය මිශ්‍ර නොකොට ගත යුතු බව නියම කොට තිබේ. දියනුමුසුව ගැනීම යනු එයයි.* ද්‍රව්‍ය ගැනීමේදී සංඛ්‍යාවෙන් මෙන්ම ප්‍රමාණයෙන් නිවැරදිව ගැනීම ඉතා වැදගත් නියමයක් විය.

විශේෂ ද්‍රව්‍ය : සමහර තෙල් වර්ග වලට යම් යම් ද්‍රව්‍ය ගැනීමට නියමිතව ඇති ප්‍රමාණ දක්වා ඇත්තේ බර හෝ පරිමාව අනුව නොව සංඛ්‍යාත්මකවය. ඉරුදපන තෙලයට එළබිං තඹුරු කොළ සතක්, කෙටල මල් තුනක්, පිච්ච මල් සතක් සහ දෙමට මල් සතක් නියම කොට ඇත.* ශ්‍රී විභූති වීරපත්‍ර තෙලයට ඉගිනි ඇට නවයක් ගැනීමට නියමිතය.

## තෙල සිඳීම

තෙල සිඳ ගැනීමේදී ප්‍රධානතම කාර්යය නම් ගින්දර දැම්මයි. ඒ සඳහා ගිනි කිරීම යන වදන භාවිත වන අතර කකාරා ගැනීම යන්න ද අන් කිසි තැනෙක යෙදෙනු පෙනේ. මෙහිලා වඩාත් වැදගත් කරුණ වන්නේ තෙලට යොදන තාප ප්‍රමාණය දක්වා ඇති ආකාරයයි. එය සාමාන්‍යයෙන් මද ගින්න ලෙස දක්වා තිබේ. එසේම මදගින්න යන්න අර්ථ

දක්වෙන්නේ ගිනිදළුව නෙළුම් මලක් සේ විහිදෙන ප්‍රමාණයයි. එය තවදුරටත් පැහැදිලි කෙරෙන විට නොඉසිරුණ නෙළුමක ප්‍රමාණය බව පෙනේ. දිව්‍යරාජ තෛලව සිදීමේදී මෙය සපු මලක ප්‍රමාණය බව සඳහන්ය. සාමාන්‍යයෙන් මෙබඳු තෙල් වර්ග සිදීමේදී භාවිත කරනුයේ පැගිරි දර වුවද සමහර තෙල් වර්ග සඳහා විශේෂ දර වර්ග නිර්දේශ කර තිබේ." මෙම දර වර්ග අතර පස් පැගිරි දර, එරමිණියා, කුරුඳු, දෙහි, දොඩම්, මිල්ල, කුඩුමිරිස්, යකිනාරං, කඹුරු ආදිය දක්නට ඇතත් මිල්ල සහ කුරුඳු දර බහුලව යෙදී තිබේ.

## තෙල පදම් ගැනීම

තෙල පදම් ගැනීමේ අවස්ථාව ඉතා වැදගත් අවස්ථාවක් බව ඒ හා බැඳුණු උපචාර විධි වලින් පෙනේ." සමහර තෙල් වර්ගයක් පදම් ගැනීමේ අවස්ථාවට නියමිත උපචාර ඉටු කළ යුතුය. සමහර තෙලක නිසි පාකයට පැමිණ පදම ළඟා වූ විට එහි අත පෙවීමට හැකි බව විශ්වාස කෙරේ." එසේම සමහර තෙල් වර්ග නියම පදමට සිදෙන විට එහි සුවඳ මුළු ප්‍රදේශය අවට පැතිරෙන බවත් ඉන් බියට පත්වන අමනුෂ්‍ය බලවේග එම ප්‍රදේශය අතහැර පළා යන බවත් සඳහන්ය." සමහර තෙල් වර්ග සිඳින විට නියමිත වත් පිළිවෙත් පුරමින් පහනක් දල්වා සිටි කළ තෙල් පදම් වන විට පහනේ දැල්ල තෙල දෙසට නැමෙන බව සඳහන්ය." විශේෂයෙන් තෙල පදම් ගැනීමේදී එහි පදම හඳුනා ගන්නා ක්‍රම එම තෙල් වට්ටෝරුවල සඳහන් වන ආකාර කිහිපයකි." ඒවා සම පදම, වළාකුළු පදම, සුදු පාට පදම, දඹ ගෙඩි පදම, දිය මෙනේරිය මලේ පදම, ලුණු වැටෙන පදම, කල්කය දුවිලි සේ වන පදම, ඉටි පදම, මී පැණි පැහැයෙන් පදම, මී පැණි සුවඳ පදම, රන්වන් පදම, නීල වර්ණ පදම, දියෙහි ඉහිරෙන පදම, සීතල පදම, දිම් ඇස් ලෙස බුබුළු නගින පදම ආදී ලෙස සඳහන් වේ.

## තෙල බෑම

සාමාන්‍යයෙන් සම්මතයක් ලෙසම දේශීය වර්ග තෙල බානු ලබන්නේ දිය පිටටය. මේ සෑම තෙලක්ම බෑමට නිර්දේශ කරන්නේද එම නියමිතයට අනුකූලවය." එසේම තෙල බෑමේදී ඒ සඳහා උතුරු දිසාවට මුහුණලා එය සිදු කළ යුතුබව ද නියමයකි." සමහර විට ලිප තැබීමෙන් පසු යම් නියමිත කාලයක් ගත වූ පසු ද සම පදමට තෙල බා පෙරා ගැනීමද අනුමත කොට තිබේ. සමහර තෙල් වර්ග බෑමට නියම කොට ඇත්තේ විශේෂිත දිනයන්හිදී ය. ප්‍රාණජීව තෛලය බා ගැනීමට නියමිතව ඇත්තේ රිවි දිනකය. ඉරුදපන තෛලය බෑමට පෙර නොයෙකුත් උපචාර නියම කොට ඇති අතර කෙම්මුර දිනයකදී එය සිදු කළ යුතුය. ඒ සඳහා භික්ෂූන් වහන්සේ සත් නමක්ද අවශ්‍යය.

## තෙල අසුරා තැබීම

තෙල බෑමෙන් පසුව සුරක්ෂිත ලෙස අසුරා තැබීමට විවිධ භාජන වර්ග නියම කොට ඇති අතර එහිදී පොදුවේ මැටිබඳුන් යොදා ගැනීම නොකරන බව පෙනේ. තෙල බෑමෙන් පසු එක්තරා කාලයක් එය සිසිල් වීම පිණිස හැළියේම තබන බව පෙනේ. එහිදී ඒ සඳහා විශේෂයෙන්ම වීදුරු, රන්, රිදී, තඹ බඳුන් නිර්දේශ කොට තිබේ. එසේම කිළිකුණු වලට හසු නොවන පරිදි ආරක්ෂා සහිතව තෙල් පවිත්‍ර ස්ථානයක තැබීම ද නියමයෙකි. සමහර තෙල් වර්ග තැබීමට නියම කොට ඇත්තේ දේවාල, විහාර භූමි වැනි සිද්ධස්ථානයක් තුළය. එසේ තබා වරින් වර දුම් ඇල්ලීම වැනි උපචාර කිරීම ද නියම කොට ඇත. සමහර තෙල් වර්ග වෙනත් විශේෂ ද්‍රව්‍ය සමඟ තැබීමට නියම කොට තිබේ. එසේම සමහර ඉතා බලගතු තෙල් වර්ග සඳහා මල් බුලත් යහන් සකසා විශේෂ මන්ත්‍ර දැහැන් පුරවා පේ කිරීමටද නියමිතය..

## පත්තියම් ඇල්ලීම

තෙල පාවිච්චි කළ යුතු කාලය මෙන්ම එම කාලය තුළ කළ නොකළ යුතු කෑ නොකෑ යුතු දේ පත්තියම් ඇල්ලීම නමින් ගැනේ. මෙබඳු තෙල් වර්ග සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම ලුණු ඇඹුල් සහ පිළිහුඩු වැළකීම අත්‍යවශ්‍ය නියමයකි.[52] උණු දිය ස්නානය කිරීම සමහර තෙලකට නියමය.[53] එහෙත් සමහර තෙල් වර්ග වලදී විශේෂ මස් වර්ග කෑමට නියම කර තිබීම ද විශේෂයෙකි.[54] ධාරණ තෛලය සඳහා සත් දින පත්තියම් වෙන වෙනම දළු වර්ග නියම කොට තිබේ. පත්තියම් සඳහා එළකිරි, සාරණ, කිකිරිදිය වැනි විශේෂ ද්‍රව්‍ය නියම කළ අවස්ථා ද තිබේ.[55]

## සත්ත බැලීම

සමහර තෙල් වර්ගවල බලය අත්හදා බැලීම සත්ත බැලීම නම් වේ. මෙය එක්තරා අන්දමක පරීක්ෂණයකි. ශ්‍රියාකාන්ති තෛලය ගුණ පණ බැලීමට අනුදන ඇත්තේ ඉරුදපනයයි.[56] රාජතරංගනී තෛලයට වෙනස් ක්‍රමයකි.[57] රාජ තරංගනී තෛලය ද ඉරුදපනයට භාවිත කරන බව සඳහන්ය.[58] මෙබඳු තෙල් වර්ගවල බලය ආරක්ෂා කිරීම සඳහා ඒවා පිටත නොදෙන ප්‍රතිපත්තියක් ද අනුගමනය කර තිබේ.[59]

## නිගමන

1. දේශීය තෙල සංස්කරණ විධිය සම්මත ආයුර්වේද භෛෂජ්‍ය කල්පනාවෙන් වෙනස් වූ අනන්‍ය ලක්ෂණ සහිතය.
2. ඊට අදාළ ව්‍යවහාරයන් සහ භාවිත විලාසයන්හි විවිධත්වයක් ඇත.
3. ඒ සඳහා යොදා ගනු ලබන ශාකමය අමු ද්‍රව්‍යයන්හි එක්තරා සුවිශේෂී ද්‍රව්‍ය ගණයක් හෝ එබඳු වර්ග කිරීමකට ලක් කළ හැකි ද්‍රව්‍ය සමූහයක් තිබේ.
4. මෙම තෛල සංස්කරණයන් හා බැඳුණු විශේෂ සංස්කෘතික ලක්ෂණ සහිත පාරිභාෂික ශබ්ද මාලාවක් තිබේ.

## යෝජනා

1. දනට අභාවයට යමින් පවත්නා මෙබඳු දනුම් එක්රැස් කොට ලේඛනගත කිරීම
2. ඒවා සම්බන්ධයෙන් කුසලතා සහිත වෛද්‍යවරුන් කැඳවා සාමූහික සංරක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම
3. එබඳු දනුමැති පුද්ගලයින් ගේ කුසලතා ඇගයීමේ වැඩසටහනක් දියත් කිරීම
4. මෙම දනුම ඉදිරියට ගෙන යාම සඳහා තිරසාර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
5. මෙම දනුම්වලට අදාළ පර්යේෂණ දියුණු කිරීම

## මූලාශ්‍ර

1. අංගම්රාජ තෛලය/ විදුරග තෛලය/දිව්‍යාංගනාදී තෛලය/ දේවරාජ අංගම් තෛලය/ යක්ෂ දුව්ලි තෛලය/ චන්ද්‍රකාන්ති තෛලය/ යක්ෂ දුව්ලි තෛලය/ මහා භෛරාජ තෛලය/ප්‍රාණජීව තෛලය/ දිව්‍යාංගනාදී තෛලය/ නාරනන්ද විෂ්ණුරාජ තෛලය/ විනරාජ තෛලය/ මහා ජීවකානන්ද තෛලය /

මහා සන්නිකුමාර තෛලය

2. විදුරග තෛලය/යක්ෂභූත තෛලය/ දේවරාජ අංගම් තෛලය/ විනරාජ තෛලය/ ගොපලු තෛලය / මහා හෙණරාජ තෛලය/ යක්ෂ දුවිලි තෛලය/ රාජ තරංගණී තෛලය /විදුරිඳු තෛලය/ සිද්ධාර්ථ තෛලය/ දේශීය නාරායන තෛලය/ ශ්‍රී විභූති විරපුත්‍ර තෛලය/ හෙණරාජ තෛලය
3. මහා හෙණරාජ තෛලය/ දේවරාජ අංගම් තෛලය/ අංගම්රාජ තෛලය/ විනරාජ තෛලය/ යක්ෂ දුවිලි තෛලය / නාරනන්ද විෂ්ණුරාජ තෛලය/ ශ්‍රී විභූති විරපුත්‍ර තෛලය/ ප්‍රාණජීව තෛලය
4. යක්ෂභූත තෛලය/ මහා හෙණරාජ තෛලය/ නාරනන්ද විෂ්ණුරාජ තෛලය/දේවරාජ අංගම් තෛලය
5. ප්‍රාණජීව තෛලය
6. ශ්‍රී විභූති විරපුත්‍ර තෛලය/ප්‍රාණජීව තෛලය
7. ශ්‍රී විභූති විරපුත්‍ර තෛලය
8. ශ්‍රී විභූති විරපුත්‍ර තෛලය/ඉරුදපන තෛලය
9. රාජ තරංගණී තෛලය / ඉරුදපන තෛලය
10. චන්ද්‍රකාන්ති තෛලය / නාරානන්ද විෂ්ණු රාජ තෛලය / යක්ෂභූත තෛලය
11. විනරාජ තෛලය / දිව්‍යාංගනාදී තෛලය
12. ශ්‍රී විභූති විරපුත්‍ර තෛලය/ නාරානන්ද විෂ්ණු රාජ තෛලය / ශ්‍රියාකාන්ති තෛලය/ ඉරුදපන තෛලය/ ප්‍රාණජීව තෛලය
13. රාජ තරංගණී තෛලය
14. රාජ තරංගණී තෛලය
15. යක්ෂ දුවිලි තෛලය
16. ඉරුදපන තෛලය / රාජ තරංගණී තෛලය
17. යක්ෂ දුවිලි තෛලය/ ප්‍රාණජීව තෛලය / ශ්‍රී විභූති විරපුත්‍ර තෛලය
18. ප්‍රාණජීව තෛලය / අංගම්රාජ තෛලය / මහා ජීවකානන්ද තෛලය / යක්ෂ දුවිලි තෛලය / විදුරිඳු තෛලය
19. මහා හෙණරාජ තෛලය / යක්ෂභූත තෛලය / ප්‍රාණජීව තෛලය / නාරානන්ද විෂ්ණු රාජ තෛලය / ඉරුදපන තෛලය
20. මහා හෙණරාජ තෛලය / දිව්‍යාංගනාදී තෛලය
21. ශ්‍රී විභූති විරපුත්‍ර තෛලය
22. ඉරුදපන තෛලය/ නාරානන්ද නම් විෂ්ණු රාජ තෛලය / බුද්ධරාජ තෛලය / දිව්‍යාංගනාදී තෛලය / මහා හෙණරාජ තෛලය / යක්ෂභූත තෛලය / මහා ජීවකානන්ද තෛලය
23. යක්ෂ දුවිලි තෛලය
24. බුද්ධරාජ තෛලය
25. යක්ෂභූත තෛලය / ප්‍රාණජීව තෛලය / රාජතරංගනී තෛලය / නාරානන්ද නම් විෂ්ණු රාජ තෛලය
26. බුද්ධරාජ තෛලය / මහා සන්නි කුමාර තෛලය
27. බුද්ධරාජ තෛලය
28. ඉරුදපන තෛලය
29. ශ්‍රී විභූති විරපුත්‍ර තෛලය
30. මහා හෙණරාජ තෛලය / සිද්ධාර්ථ තෛලය / දිව්‍යාංගනාදී තෛලය / විර මානික්කන් තෛලය

31. දේවරාජ අංගම් තෛලය / චන්ද්‍රකාන්ති තෛලය / ශ්‍රී විභූති වීරපුත්‍ර තෛලය / විදුරිඳු තෛලය
32. විදුරග තෛලය
33. දේවරාජ අංගම් තෛලය /නාරනන්ද නම් විෂ්ණුරාජ තෛලය / රාජ තරංගනී තෛලය/ යක්ෂභූත තෛලය / විදුරිඳු තෛලය / දිව්‍යාංගනාදී තෛලය
34. මහා හෙණරාජ තෛලය / ප්‍රාණජීව තෛලය / මහා පිවකානන්ද තෛලය / ඉරුදපන තෛලය
35. මහා ජීවකානන්ද තෛලය
36. රාජ තරංගනී තෛලය / යක්ෂභූත තෛලය / විදුරග තෛලය
37. යක්ෂභූත තෛලය / රාජ තරංගනී තෛලය
38. මහා ජීවකානන්ද තෛලය
39. විදුරග තෛලය/ මහා ජීවකානන්ද තෛලය/ ශ්‍රියාකාන්ති තෛලය / ගොපලු තෛලය / ශ්‍රී විභූති වීරපුත්‍ර තෛලය / දේවරාජ අංගම් තෛලය / චන්ද්‍රකාන්ති තෛලය / විදුරිඳු තෛලය/ දේවරාජ අංගම් තෛලය
40. දේවකුමාර තෛලය / දිව්‍යාංගනාදී තෛලය / මහා හෙණරාජ තෛලය / යක්ෂභූත තෛලය / බුද්ධ රාජ තෛලය / රාජ තරංගනී තෛලය
41. යක්ෂ දුම්මලි තෛලය / වීර මානික්කන් තෛලය / මහා ජීවකානන්ද තෛලය / දිව්‍යාංගනාදී තෛලය
42. නාරනන්ද නම් විෂ්ණුරාජ තෛලය / චන්ද්‍රකාන්ති තෛලය / දිව්‍යාංගනාදී තෛලය / මහා හෙණරාජ තෛලය / ප්‍රාණජීව තෛලය / යක්ෂදුම්මලි තෛලය / දේශීය නාරායන තෛලය / මහා සන්නිකුමාර තෛලය
43. ප්‍රාණජීව තෛලය
44. ඉරුදපන තෛලය
45. සිද්ධාර්ථ තෛලය
46. නාරනන්ද නම් විෂ්ණු රාජ තෛලය
47. විදුරිඳු තෛලය / දිව්‍යාංගන තෛලය
48. මහා සන්නිකුමාර තෛලය / මහා ජීවකා නන්ද තෛලය
49. ශ්‍රියාකාන්ති තෛලය / ශ්‍රියාකාන්ති තෛලය / යක්ෂභූත තෛලය / යක්ෂ දුම්මලි තෛලය/ ශ්‍රී විභූති වීරපුත්‍ර තෛලය
50. විදුරග තෛලය / රාජ තරංගණී තෛලය
51. මහා හෙණරාජ තෛලය
52. විදුරග තෛලය/ දේවකුමාර තෛලය / දිව්‍යාංගනාදී තෛලය
53. ශ්‍රී විභූති වීරපත්‍ර තෛලය
54. වීරමානික්කන් තෛලය
55. චන්ද්‍රකාන්ති තෛලය
56. ශ්‍රියාකාන්ති තෛලය
57. රාජ තරංගනී තෛලය
58. රාජ තරංගනී තෛලය
59. නාරානන්ද විෂ්ණුරාජ තෛලය

වෛද්‍ය ඩැනිස්ටර් එල්. පෙරේරා
ලේඛකාධිකාරී - ආයුර්වේද වෛද්‍ය සභාව